**විසර්ජන ශීර්ෂය - 277 මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) ප්‍රාදේශීය පරිපාලනය සක්‍රීයව,ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා ජාතික මට්ටමේ ආයතන සමඟ සම්බන්ධීකරණය හා කාර්යයන් පහසුකරණය.

(ආ) විනිවිද භාවයෙන් යුතු කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවාවක් තුළින් දිස්ත්‍රික්කයේ මහජන අවශ්‍යතා සපුරාලීම.

(ඇ) දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන් මහජන අවශ්‍යතාවයන් පිළිබඳ සංවේදීව ක්‍රියාත්මක වීමට සමත් ආකල්ප වලින් පෝෂණය කිරීම.

(ඈ) විධිමත්ව හා කාර්යක්ෂමව පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය වනපරිදි දිස්ත්‍රික්කයේ මානව හා භෞතික සම්පත් මෙහෙයවීම, කළමනාකරණය.

(ඉ) දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආදායමට බැර විය යුතු සියළු ආදායම් නිසි කලට,නිසි පරිදි එක්රැස් කරදීම.

(ඊ) රාජ්‍ය නොවන සංවිධාන වල කටයුතු විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම මඟින් දිස්ත්‍රික්කයට ගලා එන සම්පත් වඩාත් ඵලදායි ලෙස යෙදවීම සහතික කිරීම.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) බිබිල
(ආ) මැදගම
(ඇ) මඩුල්ල
(ඈ) සියඹලාණ්ඩුව
(ඉ) බඩල්කුඹුර

(ඊ) මොනරාගල

(උ) බුත්තල

(ඌ) වැල්ලවාය

(එ) තණමල්විල

(ඒ) සෙවනගල

(ඔ) කතරගම

## 1.3 විගණන විෂය පථය

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සැසඳුම් ප්‍රකාශන පොත් පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2013 ජූලි මස 08 වන දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.5 **විගණන නිරීක්ෂණ**

**-------------------**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.15දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

**(i)** මෝටර් රථ පරීක්ෂක වාර්තා, පැමිණීමේ සහතික ආදී වූ අවශ්‍ය සාක්ෂි නොලැබීම නිසා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකතුව රු.51,778 ක මුදලකට අදාල වූ ගණුදෙනු 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 7 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණ අතර එම විමසුම්වලට අදාලව ගණනය කළහැකි ගනුදෙනු වලට වටිනාකම රු.52539628 ක් විය.

**(ආ) විසර්ජන ගිණුම**

**--------------------**

- **මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.499,595,492 ක්වූ අතර වර්ෂය අවසාන වනවිට ඉන් රු.489,988,794 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.9,606,698 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | **2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත** | **2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය** | **2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක්** |
|---|---|---|---|---|

| | **ප්‍රතිපාදනය** | | | **ලෙස** |
|---|---|---|---|---|
| ------ | ------------------- | -------------------- | ----------------- | ------------- |
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 271,300,000 | 370,195,492 | 1,110,698 | 0.3 |
| මූලධන | 94,400,000 | 129,400,000 | 8,496,000 | 6.5 |
| | ---------------- | -------------------- | ------------ | |
| එකතුව | 365,700,000 | 499,595,492 | 9,606,698 | |
| | ======== | ========== | ======== | |

- **අයවැය විචලනය**

  **---------------------**

  (අ) 2012 වර්ෂයට අදාල ඇස්තමේන්තුගත වැය විෂය 277-1-1-0-1-1506 ප්‍රතිපාදන වලින් නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් 2013 වර්ෂයට අදාළ රාජ්‍ය දේපල ණය පොළී වශයෙන් රු. 345,741 ක් ගෙවා තිබුණි.

  (ආ) මුදල් රෙගුලාසි අංක 94 ට පටහැනිව ව්‍යාපෘති 01 හා 02 හි වැය විෂයයන් 08 කට අදාළව මුළු වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.827,709 ක බැරකම් වලට බැඳී තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------------------------**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 21 කින් හා දෙපාර්තමේන්තු 16 කින් පිළිවෙලින් රු. 1,744,312,888 ක් හා රු.515,509,607 ක් වශයෙන් එකතුව රු.2,259,822,495 ක ප්‍රතිපාදන ලැබී තිබු අතර, එයින් පිළිවෙලින් රු. 1,571,941,211 ක් හා රු. 470,796,434 ක් වශයෙන් එකතුව රු.2,042,737,645 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 217,084,850 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

- **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**(අ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**(i)** දිවිනැගුම වැඩ සටහන යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල ප්‍රතිලාභීන් අතර බෙදා හැරීම සඳහා රු. 1,377,000 ක්වූ පළතුරු පැල, සුළු අපනයන භෝග පැල හා පොල් පැල මිලදීගෙන තිබුණි. ප්‍රතිලාභීන්ට පැල භාරදුන් බවට ඒ ඒ පහසුකාරකයින් මාර්ගයෙන් සියළු ග්‍රාම සේවා වසම්වලින් අත්සන් ලේඛන ලබාගෙන නොතිබූ අතර 2012 ජූනි 10 දින දිවිනැගුම අංක 2/2012 චක්‍රලේඛයේ 4 වැනි ඡේදය ප්‍රකාර ගෘහ මට්ටමේ අධීක්ෂණ කටයුතු සඳහා ගෘහ ඒකක වාර්තා පොත්ද චක්‍රලේඛයේ 6 වැනි ඡේදය ප්‍රකාරව, පහසුකාරකයින් විසින් පසුවිපරම් කටයුතු කර ඇති බවට සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

(ii) අක්කර 2 ½ ක පොල් පැල වගාකිරීමේ වැඩසටහන යටතේ රු.65,625 ක් වැය කර පොල් පැල 875 ක් මිලදීගෙන තිබුණි. වානිජ්‍ය වගාව යටතේ පොල් අක්කර 2 ½ ක් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් 05 දෙනෙකු අතර බෙදාදිය යුතු පැල ප්‍රතිලාභීන් 76 දෙනෙකු අතර 10 බැගින් ද, 05 දෙනෙකු අතර 20 බැගින්ද, එක් ප්‍රතිලාභියෙකුට 15 ක් ද බෙදා දී තිබුණි.

(iii) 2012 විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ මහියංගනය පාර 01 කණුව අසල කෘෂිකර්ම ව්‍යාපෘති කාර්යාලය සකස් කිරීම සඳහා 2012 නොවැම්බර් 21 වන දින රු.24,500 ක් ගෙවා පෞද්ගලික ආයතනයකින් අඩි 8 ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 14 ක් මිලදීගෙන තිබුණි. 2013 මාර්තු 19 දින පරීක්ෂාවේදී ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ගොඩනැගිල්ලට සෙවිලි කර නොතිබූ අතර ගොඩනැගිල්ල ඉදිකරනු ලබන භූමියේද සෙවිලි තහඩු ගබඩා කර නොතිබුණි.

**(ආ) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**(i)** 2011 දිවි නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබාදීම සඳහා 2011 දෙසැම්බර් 31 දින අඹ පැල 500 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.75,000 ක් වටිනා චෙක්පතක් නිකුත්කර තිබුණි. භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොගෙන මෙම මුදල 2012 ඔක්තෝම්බර් 25 දින පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබුණි.

(ii) විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ 2011 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.63,900 ක් වූ වඩු උපකරණ සහ ක්‍රීඩා උපකරණ 105 ක් විගණන දිනය වූ 2012 දෙසැම්බර් 07 වන විටත් අදාළ ප්‍රතිලාභීන්ට බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි.

(iii) 2003 හා 2004 වර්ෂවලදී ආසියානු සංවර්ධන බැංකුව මූල්‍ය ප්‍රතිපාදන යටතේ නිම වී තිබුණු කොටබෝව ජල යෝජනා ක්‍රමයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2010 හා 2011 වර්ෂවලදී රු. 531,552 ක වියදමක් දරා තිබුණි.පසුව කර්මාන්තයේ වැඩ නිම කිරීම සඳහා 2012 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ ප්‍රතිපාදන රු. 2,000,000 ක්ද ඌව පළාත් සභා මූල්‍ය ප්‍රතිපාදන මත රු. 670,000 ක් ද අනුමත කර තිබුණ නමුත් විගණන දිනය වූ 2012 දෙසැම්බර් 07 වන විටත් ව්‍යාපෘතියේ වැඩ නිම කර නොතිබුණි.

**(ඇ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

(i) දිවිනැගුම ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ ග්‍රාම නිලධාරි වසම් වල ගෙවතු වගාව සඳහා 2012 අගෝස්තු 29 දිනැති ප්‍රසම්පාදන තීරණය අනුව බද්ධ දොඩම් පැලයක් හා බද්ධ අඹ පැලයක් රු.149.50 බැගින් මිලදී ගැනීමට තීරණය කර තිබියදී 2012 ඔක්තෝම්බර් 11 දින තවාන්කරුගේ

පෞද්ගලික ඉල්ලීම මත දොඩම් පැලයක් රු.180 බැගින් දොඩම් පැල 1900 ක් සහ බද්ධ අඹ පැලයක් රු. 160 බැගින් අඹ පැල 1900 ක් මිලදී ගැනීම සඳහා රු.77,900 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) දිවි නැගුම ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ ගෘහ ඒකක 1,900 ක් සඳහා පැල වර්ග 6 කින් පැල 13,302 ක් මිලදී ගැනීම සඳහා පැල තවාන්කරු වෙත 2012 දෙසැම්බර් 31 දින රු. 378,650 ක් ගෙවා තිබූ නමුත් 2013 ජනවාරි 31 දින දක්වාම පැල ලබාගෙන නොතිබුණි.

**(ඇ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

(i) 2012 ජුලි 10 දිනැති අංක 02/2012 දිවිනැගුම චක්‍රලේඛයේ 05.01.5 පරිච්ඡේදයේ 2 වගන්තිය ප්‍රකාර තම ගෙවත්ත තුල පොල් පැල සිටුවීම සඳහා පිළිගත් ප්‍රමිතියකට පොල් සංවර්ධන නිලධාරීන් විසින් අනුමත කළ පරිදි වලවල් කපා ගෙවතු සූදානම් කර නොතිබුන බුද්දම වසමේ ප්‍රතිලාභියෙකු වෙත පොල් පැල 64 ක් ලබාදී තිබුණි.විගණන දිනය වූ 2013 මාර්තු 13 වන විටත් ප්‍රතිලාභියාට ලබාදී තිබූ පොල් පැල 59 ක් සිටුවා නොතිබුණි. දිවිනැගුම චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාර සෑම පැලයක්ම මනා ලෙස වැඩෙන බවට බිම් මට්ටමේ නිලධාරීන් විසින් නිරන්තර අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) 2012 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මහකලුගොල්ල විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල සඳහා ඇස්බැස්ටෝස් තහඩු ලබාදීම වෙනුවෙන් 2012 දෙසැම්බර් 21 දින පෞද්ගලික ආයතනයකට ගෙවන ලද රු.100,000කට අදාළ ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 2013 අගෝස්තු 12 දින වන විටත් කාර්යාලයේ ගබඩා කර තිබුණි.

**(ඉ) බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

**(i)** බඩල්කුඹුර වසමේ අඹවත්ත මාර්ගය සංවර්ධනය කර අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය 2012 මැයි 30 වන දින රු. 980,000 ක ඇස්තමේන්තුගත මුදලකට අනුමත සමිතියකට පවරා විගණන දිනය වූ 2013 මාර්තු 25 දින වන විට කොන්ත්‍රාත්කාර සමිතියට රු.980,000 ක් ගෙවා තිබුණි .2013 මාර්තු 25 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී, මාර්ගයේ ස්ථාන දෙකක පිළිවෙලින් මීටර් 15,13 ½ ප්‍රමාණයක සිමෙන්ති මිශ්‍රණ ඉවත් වී කොන්ක්‍රීට් ගල් මතු වී තිබුණි.

**(ii)** දිවි නැගුම වැඩ සටහන යටතේ අක්කර 2 ½ ක් සඳහා ප්‍රතිලාභීන් 05 දෙනෙකුට පොල් පැල 175 බැගින් ලබාදීමට රු. 65,625 ක් ගෙවා තිබූ නමුත් 2012 ජුලි 10 දිනැති අංක 2/2012 දිවිනැගුම චක්‍රලේඛයේ 05.01.05 ඡේදය ප්‍රකාර පොල් සංවර්ධන නිලධාරිගේ නිර්දේශයක් නොමැතිව ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ පොල් පැල 175 ක් 2013 මාර්තු 20 දින වන විටත් නිසි පරිදි සිටුවීමට කටයුතු කර නොතිබුණි.

**(iii)** දිවිනැගුම වැඩ සටහන යටතේ කුකුල් පැටවුන් 1240 ක් මිලදී ගැනීම සඳහා රු.434,000 ක් වැය කර තිබූ අතර කටුගහගල්ගේ කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 12 දෙනෙකුට කුකුල් පැටවු 10 දෙනා බැගින් ලබාදී තිබුණි. 2013 මාර්තු 25 වන දින නියැදි පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 10 දෙනෙකුම කුකුල් පාලන කටයුතු වලින් ඉවත් වී තිබූ බව නිරීක්ෂණය විය.

- **ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

-----------------------------

සමෘද්ධි ජීවනෝපාය චක්‍රීය ණය සංවර්ධන වැඩ සටහන යටතේ 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ලබා දී තිබූ ණය මුදල් වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කින් දෙන ලද රු. 9,019,593 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් අය නොවී හිඟව තිබුණි.

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | කාලපරිච්ඡේදය | **හිඟ ණය ශේෂ 2012 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| ------------------------ | ----------- | ------------------------- |
| | | රු. |
| බිබිල | 2007-2010 | 2,856,301 |
| මඩුල්ල | | 1,444,547 |
| බඩල්කුඹුර | | 2,146,675 |
| තණමල්විල | 2007-2011 | 583,701 |
| සෙවනගල | | 1,328,177 |
| කතරගම | | 660,192<br>------------- |
| | | 9,019,593 |

- **තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

**තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

---

විදාතා සම්පත් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා 2009 මැයි මස සිට 2012 සැප්තැම්බර් දක්වා රු. 315,000 ක් ගෙවා තිබුණ කුලිය තක්සේරු කිරීමේ පදනම විගණනයට අනාවරණය නොවීය.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 35,000,000 | 34,324,370 | 23,000,000 | 33,186,943 | 145,000,000 | 102,577,331 |

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශන ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,523,232 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 102,344,349 ක් විය. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු. 995,334 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාර කටයුතුකර නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.8,532,736 ක් අදාල කාර්යභාරයන් ඉටු නොකර හා ඉටු කිරීමෙන් පසු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**1.6 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය**

**1.6.1 සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2012 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ

යුතු සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

----------------------------

ඉහත 1.6.1 සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.4 අභ්‍යන්තර විගණනය

----------------------

(අ) 2012 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ගණුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 1.6.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------

අංක IAI/2000/1 හා 2000 ජුනි 12 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර සෑම කාර්තුවකටම වරක් පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2012 වර්ෂය තුළ පවත්වා තිබුණේ තෙවරක් පමණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**(i)** මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය 2010 සැප්තැම්බර් සිටද, ජනපද නිලධාරී නිල නිවාසය හා තල්කොල මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2009 ඔක්තෝම්බර් මාසයේ සිට ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් යතුරු පැදියක් වසර 7 ක්ද සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ජීප් රථයක්, ඉඩම් වාහනයක් හා ට්රේලරයක් වසර 8 ක්ද, කැබ් රථයක් වසර 11 ක් ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩලය/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා 2013 මැයි 30 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

**1.8** අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කරපහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| -------------------------------------- | -------------- | ---------------------- |
| | (රු.) | |
| • **ආයතන සංග්‍රහය**<br><br>VII පරිච්ඡේදයේ 10.1 වගන්තිය | 51,265 | නිවාඩු දින වැටුප් ලබා ගැනීම සඳහා පැය 8 කට නොවැඩි කාලයක් සේවය කර ඇති බව තහවුරු නොකළ නිලධාරීන් 03 කට අවස්ථා 20 කදී නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| • **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br><br>2002 නොවැම්බර් 28 දිනැති චක්‍රලේඛ අංක අයිඒඅයි/2002/02 | | බිබිල, මැදගම, කතරගම, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**------------------------------------**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

**----------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ යුතුව තිබුණ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| ------------- | --------------- | ---------------- | ----------------- |
| | රු. | | |
| සියඹලාණ්ඩුව | 20,000 | 2012නොවැම්බර් 17 | අදාළ ප්‍රතිලාභියා 2012 |

| | | | |
|---|---|---|---|
| ළිඳක් තැනීම. | | | දෙසැම්බර් 31 දින වන විටත් ළිඳ භාරා පිරිසිදු නොකිරීම. |
| බඩල්කුඹුර කදිරේෂන් ආලයම් දේවාල ගොඩනැගිල්ල ඉදිකිරීම. | 40,700 | 2012 දෙසැම්බර් 31 දිනට පෙර | හින්දු ආගමික හේතූන් මත දින වකවානු නොගැලපීම |
| පේරකැටිය මාර්ගය කොන්ක්රීට් කිරීම. | 1,074,737 | 2012 ජුනි 25 | ඉදිරිපත් කර නොමැත. |
| වලස්කෙම වැව කුඹුරුයාය මාර්ගයේ කෝසුවක් හා දිය පැන්නුමක් ඉදිකිරීම. | 1,006,829 | 2012 ජුලි 05 | ඉදිරිපත් කර නොමැත. |
| පළු පිටිය වැව ප්‍රතිසංස්කරණය කිරීම. | 1,059,820 | 2012 මැයි 30 | ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට මත්තෙන් ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ඉටු කරන ලද වැඩ කොටස් විශාල වශයෙන් විනාශ වීම |
| තෙළුල්ල පන්සල වටේ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | 1,050,626 | 2012 ජුනි 25 | ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට මත්තෙන් ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ඉටු කරන ලද වැඩ කොටස් විශාල වශයෙන් විනාශ වීම |

## 1.10 අවිධිමත් ගණුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

**(i)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 මාර්ගෝපදේශය සහ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගත හැකි උපරිම සීමාව රු.500,000 ක් ඉක්මවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 3 ක් මඟින් පැල මිලදී ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රසම්පාදන තීරණ දිනය | මිලදී ගත් පැල වල වටිනාකම<br>රු. |
|---|---|---|
| බිබිල | 2012-12-12 | 1,053,858 |
| සියඹලාණ්ඩුව | 2012-08-15 | 2,374,862 |
| බඩල්කුඹුර | 2012-09-17 | 840,500 |

- (ii) විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් උදුලු තල 118 ක් මිලදී ගැනීම සඳහා 2012 දෙසැම්බර් 05 දින ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 27 මඟින් උදුලු තලයක් රු.750 බැගින් මිලදී ගැනීමට තීරණය කර රු.850 බැගින් මිලදී ගැනීම නිසා රු.11,800 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### (ආ) අධිකාරී බලය නොලත් ගනුදෙනු

2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 (iv) ප්‍රකාර මසකට පාවිච්චි කළ හැකි උපරිම ඉන්ධන සීමාව ඉක්මවා අනුමැතියක් නොමැතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අයත් නිල වාහන සඳහා රු.213,608 ක් වටිනා ඉන්ධන ලීටර 1878ක් ලබාගෙන තිබුණි.

**(ඇ) වෙනත්**

**--------**

**(i)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අයත් වාහන 06කට අදාලව ධාවනය කර ඇති දුර ප්‍රමාණය හා පරිභෝජනය කරන ලද ඉන්ධන සඳහා වූ වියදම් සැසඳීමේදී අවශ්‍ය ප්‍රමාණයට වඩා රු.158,079 ක් වටිනා ඉන්ධන ලීටර් 1310 ක් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක එච්ඒඑෆ්/2/19/එම්ජීටීසීඑම්/15/1907 හා 2011 මාර්තු 31 දිනැති ලිපියේ 3 වන ඡේදය ප්‍රකාර වැඩ බැලීමේ උපරිම කාලය මාස 03 ක් ඉක්මවා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී තනතුරේ වැඩ බැලීමට පත්කළ නිලධාරියාට වැඩ බැලීම වෙනුවෙන් 2010 ජුනි 01 සිට 2012 නොවැම්බර් 30 දක්වා වසර 2 යි මාස 4 ක කාලයක් වෙනුවෙන් රු.113,932ක වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12 උප වගන්තියට පටහැනිව,ප්‍රාදේශීය ලේකම්වරු හතර දෙනෙකු සහ පරිපාලන නිලධාරී පස්දෙනෙකු වෙත වැඩ බැලීමේ/රාජකාරී ඉටුකිරීමේ දීමනා රු.489,714 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 1.12 වංචනික ස්වරූපයේ ගණුදෙනු

**------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගණුදෙනු පහත දැක්වේ.

(අ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීට මොනරාගල රජයේ රෝහලේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමට යාම වෙනුවෙන් 2012 අප්‍රේල් මාසයේ දින 8 ක්ද, මැයි මාසයේ දින 07 ක්ද, ජුනි මාසයේ දින 6 ක්ද වශයෙන් දින 21 ක් සඳහා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මොනරාගල රජයේ රෝහල යන ආයතන දෙකෙන් එකම දිනයන් රු.9,250 බැගින් සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

(ආ) කතරගම ප්‍රදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් සඳහා ලබාගෙන තිබූ රු.19,733 ක් වටිනා ඉන්ධන ලීටර් 171 ක් ද ධාවන සටහන් වලට ඇතුලත් කර නොතිබුණි.

**1.13 පාඩු**

**------**

වසර ගණනාවක සිට විසර්ජන ගිණුමෙහි ඩීජීඑස්ජ් 7 ආකෘතියෙහි දක්වා තිබුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාල අලාභවල එකතුව රු. 4,038,402 ක් වූ වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු අවසන් කර නොතිබුණි.

**1.14 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

(අ) 2012 අප්රේල් 26 දින රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය විසින් රදළියද්ද සේවා පියස සඳහා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු පරිගණකයක්, පරිගණක උපාංග, පරිගණක මේසයක් සහ පරිගණක පුටුවක් 2013 මාර්තු 20 දිනවන විටත් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ආ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින්, 2011 වර්ෂයේ විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩ සටහන යටතේ මිලදී ගත් රු.269,940 ක් වටිනා උපකරණ 2013 මාර්තු 20 දින වන විටත් බෙදා හැර නොතිබුණි.

(ඇ) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2010 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ රු.500,000 ප්‍රතිපාදන මත තිඹිරිය සේවා පියස සඳහා 2011 අගෝස්තු 29 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දුන් පරිගණකය හා උපාංග 06 ක් අරමුණුගත කාර්යයට යොමු නොකර කාර්යාල ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඇ) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩ සටහන යටතේ 2012 වර්ෂයේ මිලදීගෙන තිබූ ක්‍රිකට් පිති 43 ක් සහ ටෙනිස් බෝල ටින් 21 ක් බෙදා නොහැර 2013 සැප්තැම්බර් 06 දින වන විටත් කාර්යාලයේ ගබඩා කර තිබුණි.

(ඉ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින්,විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ 2010 සහ 2011 වර්ෂ වලදී මිලදී ගන්නා ලද 9×9 උදුලු තල 182, ලීටර් 500 ජල ටැංකි 01, වොලිබෝල් 08, නෙට්බෝල් 01, ධාතු තැන්පත් ආධාරක 2 ක් හා පියෙස්ටරා ප්ලාස්ටික් පුටු 56 ක් 2013 මාර්තු 12 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා කර තිබුණි.

(ඊ) තණමල්විල ප්‍රාදේශීයලේකම් කාර්යාලය මඟින් විමධ්‍යගත සංවර්ධන වැඩ සටහන සහ ඒකාබද්ධ පවුල් සංවර්ධන වැඩ සටහන යටතේ 2007-2011 වර්ෂය දක්වා මිලදී ගත් ක්‍රීඩා භාණ්ඩ සහ විවිධ උපකරණ 358 ක් 2012 දෙසැම්බර් 12 දින වන විටත් බෙදා හැර නොතිබුණි.

(උ) කතරගම ප්‍රාදේශීයලේකම් කාර්යාලය මඟින් 2009 හා 2011 වර්ෂවලදී විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ මිලදී ගෙන තිබූ ප්ලාස්ටික් ළමා පුටු 110 ක්, ප්ලාස්ටික් ළමා ඩෙස්ක් 03 ක්, ලොකු ප්ලාස්ටික් පුටු 136 ක් හා ටෙනිස් බෝල 03 ක් 2013 ජනවාරි 29 දින වන විටද බෙදා හැර නොතිබුණි.

(ඌ) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින්,2011 හා 2012 වර්ෂවලදී විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ විවිධ ස්වේච්ඡා ආයතන සහ පුද්ගලයින්ට බෙදා හැරීම සඳහා මිලදී ගන්නා ලද භාණ්ඩ වර්ග 239 ක් විගණන දිනය වූ 2012 දෙසැම්බර් 15 දින වන විටද බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2010 ඔක්තෝම්බර් 07 වන දින රු. 467,500 ක් වැය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මිලදී ගෙන තිබූ වත්කම් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. මිලදී ගැනීමට ප්‍රථම මෙම පද්ධතිය භාවිතා කරන අන්දම පිළිබඳ කිසිදු පහසුකමක් ලබා දී නොතිබූ අතර පද්ධතියට අදාල අත්පොත්ද ලබාදී නොතිබුණි.

(ඒ) ආයතන සංග්‍රහයේ XIXපරිච්ඡේදයේ 13.1 වගන්තිය ප්‍රකාරව කුලී අය කළ යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් උපලේඛනගත නිවාස 4 කින් ආයතන සංග්‍රහයේXIX පරිච්ඡේදයේ 5.6 සහ ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යංශ ලේකම්ගේ අංක ABK/සී/7/පොදු හා 2003 අප්‍රේල් 11 දිනැති ලිපිය ප්‍රකාරව ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන ආර්ථික කුලී අයකරගෙන තිබුණි.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකට අයත් රජයේ නිවාස 6 ක් අයකරන ආර්ථික කුලිය නියමිත කාල පරිච්ඡේදය අවසානයේදී යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ උඩු මහලේ පිහිටි v වන ශ්‍රේණියේ නිල නිවාසය 1997 වර්ෂයේ සිට සමාජ සේවා නිලධාරී වෙත පදිංචියට ලබා දී තිබූ අතර, 2013 මාර්තු 14 දින වන විටත් කිසිවෙකු පදිංචිව නොසිටි නමුත් ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව පදිංචි නිලධාරීන් විසින් ජල බිල්පත් ගෙවීමට කටයුතු නොකර 1997 වර්ෂයේ සිට පදිංචි වී සිටි නිලධාරීන් විසින් කාර්යාලීය ජල සැපයුමෙන් ජලය ලබාගෙන තිබුණි.

## 1.15 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 33 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 24 | 4 | 20 |
| (iii) | ද්විතීයික මට්ටම | 653 | 524 | 129 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 109 | 99 | 10 |
| (v) | වෙනත් (අනියම්) | | 03 | |
| | | 826 | 663 | 166 |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛ ප්‍රකාර උපරිම කාල සීමාව වන අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කර ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් 41 දෙනෙකුට වෙනත්

තනතුරුවල /සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දී නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 880 වගන්තිය ප්‍රකාරව හා 1993 ඔක්තෝම්බර් 07 දිනැති ස්වදේශ කටයුතු හා පළාත් සභා අමාත්‍යංශයේ ලේකම්ගේ අංක ඊ/2/ඇප ලිපිය ප්‍රකාරව භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් හා චෙක්පත් අත්සන් කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ට අයත් නිලධාරීන් 41 දෙනෙකුගෙන් අදාල පරිදි රු. 442,500 ක ආරක්ෂණ ඇප මුදල් ලබාගෙන නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 880 හා රාජ්‍ය පරිපාලන,පළාත් සභා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්ගේ අංක ඊ/2/30 (i) හා 1991 සැප්තැම්බර් 09 දිනැති ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාලව ග්‍රාම නිලධාරීන් 75 දෙනෙකුගෙන් රු. 75,000 ක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි.